# ගම කොහේද?

# අප කොහේද?

## ගොවි ගෙදර පිළිසඳර

පිල්ලේගම ග්‍රාම සංවර්ධන සමිතියක් පිහිටුවා ගෙන. මැදගමත් ග්‍රාම සංවර්ධන සමිතියකුයි මහිලා සමිතියකුයි පිහිටුවා ගෙන. ඒ දෙකේ ම පාරවල් කපනවා. සමිති ශාලා හදනවා. ඒදඬු අළුත් කරනවා. ගෙවල් හදනවා. පුංචි ඇයන්ට මොන්ටිසෝරි කැලෑසි දල. ඔන්න ලයිට් ගන්ඩත් යනව කියල ආරංචියි, යමරෙට වැඩලු. ඒත් උඩගම. නිකන් හුලං බැස්ස වගේ. ග්‍රාම සංවර්ධන සමිති තියා ශ්‍රමදනයක්වත් කරන්ඩ බෑ. පාරවල් අඩිපාරවල් වෙලා. රජ කාලේ ඒදන්ඩ තියෙන්නෙ වතුරෙ. මොකද හේතුව. උඩගම පවුල් අතරෙ, මිනිස්සු අතරෙ නොයෙක් හුරස්පරස්. එක්කෙනාට එක්කෙනෙක් ලොක්ක වෙන්න හදනවා. පසුගිය දවසක පන්සලේ සල්පිලෙත් කෝලාහල වෙන්න හැදුවාලු.

පිල උඩ ඉඳ ගෙන පිල්ලෑවෙ සුනිලුයි, පියසිරියි මේ තත්ත්වෙ ගැන සාකච්ඡාවක්. මේ අතරට ඉස්කෝලේ මහත්තයත් එක් වුනා.

"ගම්වල තමයි රටක් හැදෙන පුරුක්. අපේ රටේ ජනතාව ගෙන් සියේට අසූවක් විතර ඉන්නෙ ගම්වල. සියයට වැඩි දෙනා ගොවිතැන් කටයුතු වලයි යෙදෙන්නේ. මිනිසුන් ගේ ජීවත් වෙන තත්ත්වය බලන කොට–ජීවිත කාලය ළදරු මරණ සංඛ්‍යාව, උගත්කම, සනීපාරක්ෂාව පෝෂණය වගේ දේවල් වැදගත්. රටක සංවර්ධනය ශීඝ්‍රයෙන් සිද්ධවෙන අන්දමටයි මිනිසුන්ගෙ ජීවන තත්වෙත් හොඳවෙන්නෙ" ඉස්කෝලේ මහත්තයා කිව්වා.

"ඇත්ත ඉස්කෝලේ මහත්තයා. ලෝකේ තියෙනකල් ප්‍රශ්න නැති වෙන්නෙ නැහැ. නමුත් අර වට්ටක ජාතකයේ වගේ මේ දුප්පත්කම කියන දැල ඉවතට ගොස් දමන්න නම් සමගිය තියෙන්න ඕනෑ මිනිසුන් අතරේ. අපිත් කල්පනා කරලා ක්‍රමයක් හරිගැස්සුවොත් මේ ගමත් සමගි කරවන්න බැරි කමක් නැහැ. මේකට මොකක් හරි මාර්ගයක් තියෙන්න ඕනෑ. අපි හොයා බැලුවොත්. උත්සාහවන්තයා ජය ගනීයි කියල කථාවක් තියෙනවා නේ" සුනිල් කිව්වා.

"මං හිතනවා ඒකට හොඳ මඟක් තමයි, මේ 'ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය' කියලා. ඒකේ තියෙන හයිය වටහා ගත්තෙත් ගම ගැන දන්න අය, ඒ කියන්නෙ මහත්මා ගාන්ධි, විනෝබාබාවේ වගේ අය. දැන් ආණ්ඩුවත් මෙතෙක් කල් නොතිබුණ තැනක් දීලා තියෙනවා මේ වැඩේට. වෙනම අමාත්‍යාංශයකුත් පිහිටුවාලා. නමුත් මේක අපට අළුත් දෙයක් නොවෙයි. අපේ පුරාණ ගති ගුණ ඔය වැඩේට අනුරූපව හැඩ ගැහිලා තිබුනෙ. දැන් ආණ්ඩුව මගින් ඒක සංවිධාන කරනවා. තවමත් ඔය 'කයිය' 'අත්තන්' වගේ ශ්‍රම හුවමාරු වැඩ 'බෙත්ම' ක්‍රමය වගේ සමගිය විදහා පාන දේවල් ක්‍රමයෙන් ඉතුරු වෙලා ආව දේ."

ඉස්කෝලෙ මහත්තයා තවත් දිගට විස්තරයක් කළා.

"මට මතකයි පොතක තිබුණා මේ වාගේ දෙයක්. ග්‍රාම සංවර්ධනය ගැන කියාපුවාම කරුණු හුහක් සලකන්න වෙනවා. එකක්, ගමේ ජීවත් වෙන මිනිසුන්ට තිබෙන ප්‍රධාන උවමනාව මොකක්ද? පාරක් හදන එක ද? දිස්පැන්සරියක් දගන්න තැනක් හදන එකද? එහෙමත් නැත්නම් නැමට, බීමට ළිං කපන එක ද? යන වගේ ඒවා

ගැන හොයල බලලා ඒවා ගැන වැඩ පිළිවෙළක් හද ගන්නයි, වැඩේ කරන්නයි හැමෝම එක් කර ගන්න එක. අනික ගමේ තියෙන භෞතික සම්පත් සත්ව සම්පත්, මිනිස්සු සම්පත්, මේ ඔක්කොගෙන් ම ගන්න පුළුවන් වැඩිම ප්‍රයෝජනයක් ගන්න අවස්ථාවක් සලසන එක යි. ගමේ ඉන්න හැමෝම මුදල් තත්ත්වය අතින් සලකන කොට දුප්පත්. ඒත්, මිනිස් කම අතින් සලකන කොට ගම්වල මිනිස්සු හරි පොහොසත්, දැන් ඔය සුළු සුළු හුරස් පරස් තිබුනට. ඉතින් අර වගේ භෞතික සම්පත් වැඩි දියුණු කරන්න මූල ධනයක් අවශ්‍ය වෙනවා. මේකට වැඩ පිළිවෙළක් සංවිධානය කරන්න පුළුවන් වන්නේ අර වගේ ගමේ සංවිධානයකට යි. ග්‍රාම සංවර්ධනය ගැන පොත් පත් වල විස්තර කරලා තියෙන්නේ ගමේ සියළු ම අංශ අහුවෙන තාලෙට සිදු කරන සමාජ ආර්ථික වෙනස් කම් පිළිබඳ කාර්යාවලියක් කියාල යි. මේ වැඩ පිළිවෙළවල් ගැන සලකන කොට හැම රටකටම, දේශයකට ම එකම ආකාරයේ සැලස්මක් ගැළපෙන්නේ නැහැ. රට රටවලත්, රටක් ඇතුලේ පළාතෙන් පළාතටත්, ගමින් ගමටත් වෙනස්කම් තියෙනවා. අප හදන වඩන ආගම්, සමාජ සිරිත් විරිත් සම්ප්‍රදය එසේ තැනින් තැනට වෙනස් වෙනවා. ඉතින් සැලැස්මවලුත් ඒ අන්දමට හද ගලපා ගන්න ඕනෑ''.

අන්තිමේ දී මේ තුන් දෙනා ගේ තීරණය වුනේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරී කෙනෙකු හම්බ වෙලා මේ අදහස ගැන ටිකක් ගැඹුරින් සොයා බැලීමට යි.

* * *

**පෙරේරා මහත්මයා** දැන් අවුරුදු දහයක පහලොවක ඉඳලා සේවය කරන ග්‍රාම සංවර්ධන නිලධාරියෙක්. ජයසිරිටයි, සුනිල්ටයි, ඉස්කෝලෙ මහත්මයාටයි, ලංකාවේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ගැන හොඳ විස්තරයක් උන්නැහේගෙන් දැන ගන්න ලැබුණා. ඒක විස්තර උනේ මේ අන්දමටයි.

''මේ ගම් සංවර්ධන වැඩ පිළිවෙළ කරන්නට ආණ්ඩුව පටන් ගත්තේ 1940 විතර. වෙනම ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවක් පිහිටු වන කොට 1948 උනා. එතන ඉඳලා තමයි රට පුරා ග්‍රාම සංවර්ධන සමිති පිහිටු වන්නට පටන් ගත්තේ. මේවා ගම්මට්ටමේ සංවිධානය කරන්න ග්‍රාම සංවර්ධන නිලධාරී නැත්නම් ආර්. ඩී. ඕ. ලා පත් උනා, ඔය ආරම්භය. ඊළඟට පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් දෙපාර්තමේන්තුව පටන් ගත්තා. 1951 දී පිළිමතලාව, නාලන්ද, නිකවැරටිය, මාදම්පේ, අච්චුවේලි, මඩකලපුව, මැදවච්චිය, බිඳුණුවැව, පුස්සැල්ලාව හා දික්වැව යන ස්ථානවල ඒකට මධ්‍යස්ථාන පටන් ගත්තා. මේ කාලයේ ම තමයි කාන්තා සමිතිත් පටන් ගත්තේ. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයක අමාත්‍ය මණ්ඩල තත්ත්වයක් නැත්නම් අමාත්‍යාංශයක් ඇති උනේ 1978 දී.

**හොඳයි, මේ වගේ විශේෂ තත්ත්වයක් ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයට ලැබෙන්න හේතුව මොකක් ද?** ජයසිරි ප්‍රශ්න කළා.

පෙරේරා උන්නැහේ ටිකක් ඔළුව කැහුවා. ඊට පස්සේ නැගිටලා ගිහිල්ලා ටිකක් දූවිල්ල වැදිච්ච පයිල් එකක් උස්සා ගෙන ආවා. ''මේක තමයි අළුත්ම චක්‍ර ලේඛනේ. ජාතික මට්ටමේ ග්‍රාම සංවර්ධනය ගැන සැලකිලිමත්ව කටයුතු කරන එක තමයි දැන් තියෙන විශේෂත්වය. මේක ටිකක් අහගන්නකො.''

- ග්‍රාමීය ජනතාව ගේ සමාජ ආර්ථික සංස්කෘතික තත්ත්වය ඔවුන් විසින් ම පිහිටුවා ගන්නා ග්‍රාමීය සංවිධාන මගින් නංවා ලීම සහ ඒ සඳහා අවශ්‍ය උනන්දුව ඇති කර ලීම. ඔවුන් ගේ ප්‍රයත්නයන් දිරි ගැන්වීම.

- මේ සමිති මගින් ඒ ඒ පෙදෙස් වල ඇති රජයේ අනිකුත් ව්‍යාප්ති සේවාවන් වලට සම්බන්ධ සංවිධාන සමඟ කිට්ටු සම්බන්ධතාවයකින් කටයුතු කිරීම. ඊළඟට මේවායෙන් ඉටු කර ගන්න බලාපොරොත්තු වන වැඩ-

- පුරුෂයින් හා කාන්තාවන් යන දෙපක්ෂයට ම සහභාගි විය හැකි ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවා ලීම.

- ප්‍රජා සංවර්ධනය උදෙසා ග්‍රාම සංවර්ධන කමිටුවල නිල තල උසුලන අයට මෙන් ම සාමාන්‍ය සාමාජිකයින් ටත් කටයුතු කර ගෙන යැමට අවශ්‍ය පුහුණුවක් ලබා දීම.

- මේ සමිතිවලින් ආරම්භ කරන ආත්මෝපකාර වැඩ පිළිවෙළවල් වලට දිරි දීම.

- ප්‍රාදේශීය සංවර්ධනය මෙන් ම ජාතික සංවර්ධන කටයුතු වලටත් අවශ්‍ය ස්වේච්ඡා ශ්‍රමය සංවිධානය

- ඒ කටයුතු වලට අවශ්‍ය මුදල් ආධාර සැපයීම.

**අපේ ගමෙත් ග්‍රාම සංවර්ධන සමිතියක් සංවිධානය කර ගන්න ඕනෑ මූලික පියවරවල් මොනවා ද?**

''ග්‍රාම සංවර්ධන සමිතියක් කියන්නේ ගම මට්ටමේ ස්වේච්ඡා සංවිධාන විශේෂයක්. සමිතියට ගමේ අවුරුදු 18 ට වැඩි ඕනෑම කෙනෙකුට සාමාජිකත්වය ලබා ගන්න පුළුවනි. මෙහි නිලතල අනිත් ඕනෑම සමිතියක නිලතල වගේ ම යි. සභාපති, උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, කාරක සභාව, සාමාජිකයින් විසින් පත් කර ගන්නවා. ඊළඟට මේ සමිතියක් දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කරවන්න ඕනෑ. එනකොටයි, දෙපාර්තමේන්තුව පිළිගන්නේ. ඊට පස්සේ ඒ ප්‍රදේශය භාර ග්‍රාම සංවර්ධන නිලධාරී තැන ගේ සුපරීක්ෂාව යටතේ ඒකෙ කටයුතු කර ගෙන යනවා.''

**සාමාන්‍යයෙන් ගම මට්ටමේ ඔය ගොවි කාරක සභාවල් වගෙ සංවිධානයක් ඇති කරන්නේ පාර්ලිමේන්තු පනතක් අනුවයි. දැන් එහෙම පදනමක් නැතිව ස්වේච්ඡාවෙන් පමණක් පිහිටු වන ග්‍රාම සංවර්ධන සමිති වලට ඇති වන තත්ත්වය මොකක්ද? ඒ ඇහුවෙ ඉස්කොලේ මහත්තයා.**

''මේක වැදගත් කාරණයක්. ඇතැම් විට සමිතිවල වටිනාකම දේශපාලනඥයින්ට, පරිපාලකයින්ට, සාමාන්‍ය ජනතාවට ඒත්තු යෑමට හේතු වෙන එක් කාරණයක් වන්නේ ස්වේච්ඡා පදනමකින් පිහිටුවීම යි. ඒ උනත් පසුගිය ද කොන්රඩ් එඩිනර් පදනම මේ රටේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ගැන කළ පර්යේෂණයකින් හෙළි වී තියෙන්නේ මෙරට ඇති ග්‍රාම සංවර්ධන සමිති වලින් 50% ට වඩා අවුරුදු 20කට වඩා පැරණි ඒවා ය, යන වගයි. ගමේ සමිති රැසක් ඇති වී නැති වී යන කාලේ මෙතරම් කාලයක් යම් කිසි සංවිධානයක් පැවතීමට නම් ඒවායේ ශක්තියක් මුල් බැස ගෙන තිබෙන්නට ඕනෑ.

''ඒ පර්යේෂණයෙන් ම පෙන්නුම් කරපු තවත් වැදගත් කාරණයක් නම් මෙරට ගම්වල ජීවත් වන අයගෙන් සාමාන්‍යයෙන් 12% ක් විතර අය ග්‍රාම සංවර්ධන සමිති වල සාමාජිකයෝ කියන එක. ගමේ සංවර්ධන සමිතිය හොඳ අවස්ථාවක් සලසනවා ගමේ සාකච්ඡා සභාව හැටියට. ගම් වාසීන් ගේ ප්‍රශ්න හංගන්නෙ නැතිව කථා කරන්න පුළුවන්. උවමනා එපාකම් කියන්න පුළුවන්. මේ විදියට අදහස් හුවමාරු කර ගෙන ගමේ රටේ තියෙන දේවල් දියුණු කර ගන්න වැඩ පිළිවෙළක් සකස් කරගන්න පුළුවන්.

''දැන් අප ගේ වැඩ පිළිවෙළ යටතේ රටේ ග්‍රාම සංවර්ධන සමිති 15,000 ක් වත් අඩු තරමින් පිහිටු වන්න අපි අදහස් කරනවා. අන්තිමේදී එක ගමකට එක සමිතියක් ගානේවත් පිහිටුවන එකයි අපේ පරමාර්ථය.

මේවා කර ගෙන යන කොට ප්‍රශ්නවලට මුහුණ පාන එක වලක්වන්න බැහැ. දැන් ඔය සමිති සමාගම්වල කටයුතුවලදී මුහුණපාපු ප්‍රධාන ප්‍රශ්න මොනවාද මහත්මයා–ඉස්කෝලෙ මහත්තයා ඇහුවා.

''ඕනෑම වැඩක් කරන කොට ප්‍රශ්නවලට මුහුණ පාන්නට වෙනව. ඒවාට යටනොවී ජයගන්න එකයි.හපන්කම.

1 රජයේ නිලධාරීන් අවශ්‍ය කරන තරමට ග්‍රාම සංවර්ධන සමිතිවල වැඩ කටයුතු සම්බන්ධයෙන් උනන්දුවක් නොදැක්වීම.

2 සාමාජිකයින් අතර ප්‍රශ්න, දුර්වල මුදල්/ආර්ථික තත්ත්වය, සහයෝගය මදි කම, වේලාවක් නො මැතිවීම, සමිතියේ නිල තල උසුලන අය අතර ප්‍රශ්න මතු වීම, සාමාජිකයින් ගේ වයස් පරතරය නිසා මතු වන ප්‍රශ්න.

3 ග්‍රාමීය මට්ටමේ නොයෙකුත් සංවිධාන අතර තියෙන තරඟය.

4 රජයෙන් ලැබෙන ආධාර ප්‍රමාණවත් නොවීම.

5 තාක්ෂණික/කළමණාකරණ විශේෂඥ සේවයක් හරිහැටි නොලැබීම.

6 රැස්වීම් ශාලාවක් පුස්තකාල පහසුකම්, නැතිවීම තවත් එකක්.

මේවත් ඇති වන වග බලා ගෙන කටයුතු කරන්න ඕනෑ.''

● ●

**උඩුගමත් ග්‍රාම සංවර්ධන සමිතියක් පිහිටුවලා කටයුතු කරන හැටි දැන් සුනිල් ගේ හිතේ ඇඳිලා. පෙරේරා උන්නැහැගෙන් සමු ගත් තුන් දෙනා ම ආපසු බස් නැවතුම් පලට ගියේ බර කල්පනාවකින්.**